# විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව



## ආගමන විගමන පාලක බණ්ඩාර අබේකෝන් මහතා සමඟ සාකච්ඡාවක්

පසුගිය දා මෙල්බන් සංචාරයක නියුතු වූ ආගමන විගමන පාලක බණ්ඩාර අබේකෝන් මහතා හමුවීමට සීතල සන්ධ්‍යාවක ඔහු සිටි නිවසට ගියෙමි. මා දුටු මොහොතේම සුහද සිනාවකින් මුව සරසාගෙන ආදරයෙන් පිළිගැනීම සිත් සතුටු කරවන්නක් විය.

අපි දෙදෙනාම ඉතා සුවපහසු ආසනයක වාඩි වී සුවදුක් ආගිය තොරතුරු කතා කළෙමු. ඔහු ඉපදී තියෙන්නේ ත්‍රිකුණාමලයේ. පාසැල් ගියේ කැකිරාව මධ්‍ය මහා විද්‍යාලයට. ඔබ ඉන්පසුව උසස් අධ්‍යාපනය කළේ කොහේද? මම ඇසුවා.

කැලණිය විශ්වවිද්‍යාලයේ

ඔහුත් මාත් එකම සරසවියක එකම ගුරුවරුන්ගෙන් ඉගෙන ගත් නිසා අපි දෙදෙනා තවත් සමීප මිතුරන් බවට පත්විමු.

කථාව අතර වාරයේදී සුනිල් විජේසිරි මහතාගේ පුතනුවන් පිළිගැන්වූ රසවත් තේ කෝප්පයද තොලගාමින්ම අපි ආයෙත් කතාබහේ යෙදුනෙමු. ඉතින් ඔබ විශ්වවිද්‍යාලයෙන් පස්සේ 82 දී සිවිල් සේවා විභාගය කළා. ඉන්පස්සේ උපදිසාපති කෙනෙක් වුණා. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් වැඩ එනකොට

**කොපමණ කල් වෙනවද ඔය තනතුරේ වැඩ බාරගෙන?**
අවුරුදු 2 ක් වෙනවා.

ඔබතුමා කියන්න මුලින්ම, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් සිදුවන ප්‍රධාන කාර්යයන් .

1. ගමන් බලපත් නිකුත් කිරීම.
2. පිටරට උපදින ළමයින්ගේ උපත් ලියාපදිංචි කිරීම.
3. ද්වත්ව පුරවැසි සහතික නිකුත් කිරීම.
4. පිටරට සිට ලංකාවට යන්නන්ට වීසා නිකුත් කිරීම.
5. විදේශිකයනට පුරවැසිකම් ලබාදීම.

**ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී අවශ්‍ය වන ලියකියවිලි මොනවාද?**
කලින් ගමන් බලපත්‍රය. හැඳුනුම්පත හා මුල් උප්පැන්නය.

**එතකොට මෙහිදී අවශ්‍ය වෙනවා නේද වීසා සනාථ කිරීමේ මුදල් ගෙවා ලබා ගන්නා සහතිකය.**
නෑ එයට මුදල් ගෙවන්නේ නොදැනුවත් කමින්. එයට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න පුළුවන්.

**මෙහාට ගොඩාක් ප්‍රයෝජනවත් ප්‍රශ්නයක් තියෙනවා. වැඩි දෙනෙක් කියන කතාවක් මෙහේ පුරවැසිභාවය ලබා ගත් අයත් මෙහි ඉපදුන දරුවන්ට ශ්‍රී ලංකාවේ වීසා ලබා ගන්න පුළුවන් මාසයද?**
නෑ. ගුවන්තොටුපළේදී මාසයක් දුන්නත් එය ගෙවී යාමට පෙර ඉල්ලුම් කළ යුතුයි. එවිට දීර්ඝ කරගත හැකියි. මාසයයි කියලා අනියත බියක් ඇති කරගත යුතු නෑ. අනෙක එක අතකින් ශ්‍රී ලංකාවේ ඉපදිලා එහි ඉන්ඩ බැරි ඇයි. හැබැයි විදේශිකයන්ට නම් මාස 3 යි.

**අපේ ශ්‍රී ලාංකිකයනට මෙහේ උපදින දරුවන් ලංකාවේ ලියාපදිංචි කරන්න ඕනෑද?**
ඔව්, විදේශ ගත ශ්‍රී ලාංකිකයෙකුට දරුවන් ඉපදුනහම ඔවුන් ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හරහා ලියාපදිංචි කළ යුතුයි.
මෙහි කොටස් 2 කි.

1. කන්සියුලර් උප්පැන්නය ලබා ගැනීම (රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයෙන්)
2. එම උප්පැන්න සහතිකය සමඟ ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් අයදුම් කළ යුතුයි පුරවැසි භාවයට.

මෙම ලියාපදිංචියෙන් පසුව ශ්‍රී ලංකාවේ හෝ පදිංචිව සිටින රටේ හෝ සිටිය හැකිය. මෙසේ ලියාපදිංචි නොකර තිබේ නම් අපහසුතා රාශියක් ඇතිවේ. මෙහි දෙමාපියන් ඒ ගැන දැනුවත් විය යුතු අතර, එම දරුවන්ට 18 පසුව සුදුසු තීරණයක් ගත හැකිය.

> *විදේශයක පුරවැසි බව ලබා තිබේ නම් පසුව ශ්‍රී ලංකාවේ පුරවැසි බව ලබා ගන්නට හැකිද? සමහර අය එය නොහැකි බව ප්‍රකාශ කරනවා. එහි සත්‍යයක් තියෙනවාද?*
> *ඒක අසත්‍යයක්, විදේශීය පුරවැසිභාවය ලබා ගැනීමට පෙරදී මෙන්ම පසුවත් ද්විත්ව පුරවැසි බව ලබා ගන්නට පුළුවනි.*

**විදේශයක පුරවැසි බව ලබා තිබේ නම් පසුව ශ්‍රී ලංකාවේ පුරවැසි බව ලබා ගන්නට හැකිද? සමහර අය එය නොහැකි බව ප්‍රකාශ කරනවා. එහි සත්‍යයක් තියෙනවාද?**
ඒක අසත්‍යයක්, විදේශීය පුරවැසිභාවය ලබා ගැනීමට පෙරදී මෙන්ම පසුවත් ද්විත්ව පුරවැසි බව ලබා ගන්නට පුළුවනි.

ඒ සඳහා සුදුසුකම් සඳහන් කළොත් ඔබ මේ මූලික සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කළ යුතුයි.
1. වයස අවුරුදු 55 ට වැඩි නම්
2. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ සමාන සුදුසුකමක්.
3. ලංකාවේ ලක්ෂ 25 කට වැඩි දේපල තිබේ නම්, (ඉඩම්, මුදල්) (නිශ්චල)

**මේ සඳහා ලියකියවිලි මොනවාද අවශ්‍ය වෙන්නේ?**
උප්පැන්න සහතිකය
ගමන් බලපත්වල පිටපත් (සහතික කල පිටපත්)
වීසා සඳහන් පිටුව හා විස්තර සඳහන් පිටුව
විදේශ ගමන් බලපත් තිබේ නම් විස්තර පිටුව
පියා ලංකාවේ උපත ලැබූ බව සනාථ කළ හැකි සාධක එකක් සම්පූර්ණ විය යුතුය.
(උප්පැන්නය, මරණ සහතිකය, දිවුරුම් පෙත්සමක්
මේ සහතික පිටපත් ජේ.පී. (සාමදාන විනිච්චකරුවකුගෙන්) කෙනෙකු හෝ නීතිඥයෙකු සහතික කළයුතු වේ.

**ඔබ හිතන්න මේ සියල්ල සම්පූර්ණ කලා කියලා එය යවන්නේ කොහාටද? ඒ වගේම මුදල් කොපමණ ප්‍රමාණයක් ඒ සඳහා වැය වෙනවාද?**
අයදුම් පත්‍රය මෙහි මහකොමසාරිස් කාර්යාලය හරහා හෝ ආගමන විගමන දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුයි.

මුදල් වශයෙන් ප්‍රධාන අයදුම්කරුට (ශ්‍රී ලංකා මුදල්) ලක්ෂ 2 යි. අනෙක් අයට 50,000 බැගින්. එහෙත් අවුරුදු 18 වැඩි අයට ලක්ෂ 2 බැගින් ගෙවිය යුතුයි.

ඒ වගේම ද්විත්ව පුරවැසිකම ලබා ගන්නා තවත් ක්‍රමයක් තියෙනවා.

**මොකක්ද ඒ ක්‍රමය**
ලංකාවේ මහ බැංකුව නියම කරන ලද බැංකුවක ඇමරිකානු ඩොලර් 25,000 ක් අවුරුදු 3 ක් ස්ථිර තැන්පතුවක දමයි නම්, මුළු පවුලට ලක්ෂ 2 කයි. එම තැන්පතුව 50,000 ක් නම් නොමිලයේ ලබා ගන්න පුළුවනි.

**දළ වශයෙන් මේ සඳහා කොපමණ කාලයක් වගේ ගත වෙනවාද?**
ඇත්තටම මාස 2 ක් වැනි සුළු කාලයක්. ඒත් ලියකියවිලි පරීක්ෂා කිරීමේදී ඒ සඳහා අපහසුතා තිබුනහොත් කාලය ටිකක් දීර්ඝ වෙන්න පුළුවන්. මාසයකට වතාවක් ද්විත්ව පුරවැසි කමිටුව රැස් වෙනවා. ඉන් පසුවයි අනුමත කරන්නේ.

ඒ වගේම මහින්ද තවත් කාරණයක් මතක් කළ යුතුයි. කාලය ඉක්මුණ හෝ අළුතෙන් ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේදී කලින්ම ඒ සඳහා අයදුම් කළ යුතුයි.

විශේෂයෙන් මෙහිදී කිවයුතුයි ලංකාවට වලංගු කාලය නොමැති නම් විශේෂ (අවස්ථාවකදී) ඒ සඳහා පහසුකම් ද ලබා දිය හැකිය.

**අන්තිම වරට මට තව කාරණයක් මතක් වුණා. ද්විත්ව හා ගමන් බලපත්‍ර සඳහා එවිඩන්ට් සහතිකයක් මෙහින් මුදල් ගෙවා ගත යුතුද?**
නෑ අවශ්‍ය නෑ. ඒ සඳහා දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න පුළුවනි.

**වැදගත්ම දෙයක් තියෙනවා. මේ කරුණුවලට අමතරව මොනවා හරි දෙයක් ඔබෙන් අහන්න මෙහෙ අයට අවශ්‍යතාවයක් උනොත්,**
දෙපාර්තමේන්තුවේ ඕනෑම දෙයක් තියෙනවා නම් මට කතා කරන්න.

යොමුව - පී.බී. අබේකෝන්
දුරකතන - 94115329405
ෆැක්ස් - 94112674621
ඊ-මේල් - controller@immigration.gro.lk

රෑ බෝවී තිබුණ බැවින් තවත් ටිකක් ආගිය තොරතුරු කතා කොට සුහදශීලී ප්‍රසන්න වූ මිතුරෙකුගෙන් වෙන්වීමේ දුකත් සිතේ දරාගෙන නිවස බලා පිය නැගුවෙමි.

**මහින්ද දිසානායක දිවුල්ගනේ**







ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුළුව...
ගොඩවන්න... විඳගන්න...
www.thisara.com